**ශීර්ෂය 198 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** | | |
| මූල්‍ය ප්‍රකාශන සමඟ එක් එක් වැඩසටහන් ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය සිදු කර ඇති ආකාරය ඒසීඒ - 2(v) ආකෘතිය මගින් ඉදිරිපත් කළ යුතු වුව ද, වැඩසටහන - 02 සංවර්ධන වැඩසටහනට අදාළව එපරිදි කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 267/2018 සහ 2018 දෙසැම්බර් 21 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු හා එකඟ වේ. අංක 02 දරන සංවර්ධන වැඩසටහන යටතේ මූල්‍යකරණය සකස් කළද අදාල මූල්‍යකරණ වාර්තාව එකලස් කිරීමේදී අදාල ආකෘති මග හැරී ඇත. ගිණුම් වාර්තාව විගණනයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම ආකෘතිය නැවත විගණන අධිකාරී වෙත බාර දෙන ලදී. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගැලපුම් ගිණුම අනුව වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙනුවෙන් වාරිමාර්ග අමාත්‍යාංශය දරන ලද වියදම රු.7,197,513 ක් වුවද මාසික ගිණුම සාරාංශ සහ අනිකුත් තොරතුරු අනුව එය රු.7,302,120 වුයෙන් රු.104,607 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්රකාශණ නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | මෙම වෙනස අධිභාර කිරීම නිසා සිදු වී ඇත. එය ශේෂය සඳහා බල නොපායි. |

### 1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ අමාත්‍යාංශය සතුව පවතින දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.219,005,345 ක් ලෙස දක්වා තිබුණ ද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එදිනට දැක්වෙන දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.45,926,459 ක් අඩුවෙන් එනම් රු.173,078,887 ක් ලෙස දක්වා තිබුණි. | වත්කම්වල වටිනාකම නිවැරදිව ගණනය කර ගිණුම් ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වීම. | එකඟ වෙමි. 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව සියළුම වත්කම් ගිණුම් වල ලෙජර ශේෂයන් සමඟ දෙපාර්තමේන්තු පොත්වල ශේෂයන් සමඟ තුලනය විය යුතු බව උපදෙස් ලැබුණු බැවින් එසේ සමාන කිරීම සඳහා භාණ්ඩාගාර පොත් වලට මාරු කිරීමේ සටහන් මගින් ගැලපීම් කරන ලදි. |
| (ආ) | අමාත්‍යාංශය සතු වාහන 129 ක් වෙනත් දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ ජල සම්පත් මණ්ඩලයට ලබා දී තිබුණ ද එම ආයතනවලට අයිතිය පවරාදීමට කටයුතු කර නොතිබුණු අතර එම වාහනවල වටිනාකම ගණනය කර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවත් එ පරිදි කටයුතු කර නොතිබුණි. | වෙනත් ආයතන වෙත ලබා දී තිබෙන වාහන එම ආයතනය වෙත පවරා දීමට හෝ නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | වාහන 314 අතරෙන් වාහන 148 ක් පරිහරණය කරනු ලබන ආයතන වෙත පවරා දී ඇති අතර ඉතිරි ප්‍රමාණය පවරා දීමට කටයුතු කරමින් පවතී. තවද ව්‍යාපෘති වල වාහන ව්‍යාපෘතිය අවසන් වූ පසුව පවරා ගැනීමට කටයුතු කරමි. |

### 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හඳුනානොගත් රු.434,066 ක ණය මුදලක් අත්තිකාරම් "බී" ගිණුමේ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය තුළ ඇතුළත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය | හඳුනානොගත් ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය. | වර්ෂ 15ටත් වඩා පැරණි වූ රු.434,066 ක ශේෂය හඳුනා ගැනීමට මේ දක්වා නොහැකි විය. ඉදිරියේදි මහා |

| | | |
|---|---|---|
| අවසාන වන විටත් මෙය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරමි. |

### 1.6.5 අග්‍රිම ශේෂය

----------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු අග්‍රිම ගිණුම අනුව වෙනත් ලැබීම් රු.22,146,127 ක් ලෙස දක්වා තිබුණ ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම රු.13,794,298 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව 8,351,829 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් සැසදීමක් සිදු කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස දක්වා ඇත්තේ මුළු ලැබීම්වලින් භාණ්ඩාගාර අග්‍රිම තැන්පත් ලැබීම් හා අත්තිකාරම් බී ගිණුම යටතේ ලැබීම් අඩු කළ විට ආදායම් ශීර්ෂ යටතේ ලැබීම් වටිනාකමයි. |

### 1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-----------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරික්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) | **පරිගණක, උපාංග සහ මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක **IAI/**2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව යාවත්කාලීන කළ පරිසණක, උපාංග සහ මෘදුකාංග ලේඛනයක් වාරිමාර්ග කළමනාකරණ අංශයේ සහ කොත්මලේ පිහිටි වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ පවත්වාගෙන නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක **IAI/**2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක , උපාංග සහ මෘදුකාංග පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මේ වන විට පරිගණක උපාංග සහ මෘදුකාංග ලේඛනයක් ආරම්භ කර යාවත්කාලීන කරමින් පවතී. |

(ආ) ඇප තැන්පත් ලේඛනය
----------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයින්ගේ තොරතුරු පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891 (1) සඳහන් තොරතුරු ඇතුලත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරින් පිළිබඳ ඇප තැන්පත් ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | පිළිගෙන ඇත. ඉදිරියේ දී නිර්දේශ අනුව කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

## 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>------------<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව<br>---------------- | <br><br>අනුකූල නොවීම<br>---------------- | නිර්දේශය<br><br><br>------------ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------- |
|---|---|---|---|
| (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396(ඩී) | නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ චෙක්පත් ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වුවත් වටිනාකම රු.36,115 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 12 ක් පිළිබඳව එපරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396(ඩී) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය | අමාත්‍යාංශයෙන් පිටතට ස්ථාන මාරු වී ගිය නිලධාරින් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.886,631 ක් වූ ණය මුදල ස්ථාන මාරුවී ගොස් මාස 02 ක් ඇතුළත අයකර ගත යුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි. | ජාතික අයවැය දෙපාර්තමේන්තු වේ අධ්‍යක්ෂකගේ අංක 118 සහ 2004 ඔක්තෝබර් 11 දිනැති අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | එම ශේෂ නිරවුල් කිරීම සඳහා මේ වන විට ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගෙන් ණය අයකර ගැනීමට කටයුතු කර ඇති අතර ඉතිරි ණය ප්‍රමාණය අදාල නිළධාරීන්ගේ මාසික වැටුපෙන් අයකර ප්‍රේෂණය කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 අග්‍රිම කළමනාකරනය

-----------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය ඉටුකිරීමට සැලැසුම් කරන ලද කාර්යයන් ඉටුකිරීම සඳහා සැලසුම් කළ අග්‍රිම අවශ්‍යතාවය රු.9,131,157,730 ක් වී තිබුණි. භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කළ මුළු අග්‍රිම අවශ්‍යතාවය රු. 6,596,954,000 ක් වී තිබුණු අතර භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු අග්‍රිමය රු.680,302,000 ක් වී තිබුණි. භාණ්ඩාගාරයෙන් නොලැබුණු අග්‍රිමය ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 89.69 ක් වී තිබුණි. එම කරුණ හේතුකොට ගෙන වැඩසටහන් අංක 01 හා 02 යටතේ පිළිවෙලින් වැය විෂයයන් 03 ක් සහ 05 ක් සඳහා සිදු කළ මුළු ප්‍රතිපාදනය ම ඌන උපයෝජිතව පැවතුණි. | සැලසුම් කළ පරිදි අග්‍රිම ලබා ගැනීමට සහ යෙදවීමට ක්‍රියා කළ යුතු වීම. | විගණන විමසුමෙන් පෙන්වා දී ඇති කරුණු පිළිගනිමි. |

## 2.2 තැන්පත් ශේෂයන්

---------------------

පහත සදහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ 2 කට වඩා පැරණි රු.1,113,533 ක තැන්පත් ශේෂ පවතින අතර එම තැන්පතු මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | කොන්ත්‍රාත්කරුවන්ගේ රැදවුම් මුදල් ඉල්ලුම්කරන ලෙස ඔවුන්ට දන්වා ඇත. ඉදිරියේදී මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කිරිමට වග බලා ගන්නා ලෙස සියළුම ආයතන ප්‍රධානීන් දැනුවත් කරනු ලැබේ. |
| (ආ) | කොත්මලේ ජාත්‍යාන්තර පුහුණු ආයතනයේ සේවයේ නියුක්ත සේවකයන්ගෙන් 2017 සහ 2018 යන වර්ෂවල වැටුපෙන් කපා ගන්නා ලද රු.927,580 ක් වූ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් දායකය ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රදවාගෙන තිබුණි. | 1942 අප්‍රේල් 01 දිනැති අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අඥාපනත අනුව කටයුතු කළ යුතු වීම. | කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අනියම් කම්කරුවන්ගේ වැටුපෙන් 2017 හා 2018 වර්ෂවල අයකර ගන්නා ලද දායකත්වය වේ. ආයතනය විසින් ගෙවිය යුතු සියයට 12 ක ප්‍රමාණයට අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට නොහැකි වීම මත ගෙවා නොමැත. කඩිනමින් ගෙවීමට පියවර ගනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රධාන සහ මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අමාත්‍යාංශය වෙත වෙන් කර තිබුණු ප්‍රතිපාදනවලින් රු.54,828,946 ක මුදලක් වැය කර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වැව් 03 ක් ප්‍රතිසංස්කරණය කර තිබුණි. එහෙත් ඉන් රු.3,709,955 ක් වැය කර ප්‍රතිසංස්කරණය කරන ලද මුදියන්නෑගම වැවෙන් වගා කරමින් තිබුණු කුඹුරු ඉඩම් අක්කර 15 න් 14 ක් ම ගොඩකර ගොඩ ඉඩමක් බවට පත්කර තිබුණි. | වෙනත් ආයතන සතු වත්කම් සංවර්ධනය කිරීමේදී භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතිය හා ප්‍රතිපාදන ලබා ගත යුතු වීම හා අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් වියදම් දැරීම පිළිබඳව සොයා බලා විධිමත්ව කටයුතු කළ යුතු වීම. | විගණන විමසුමේ සඳහන් මුදියන්නෑගම වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/3/13 ජ.කා.ලි./කුරු2017 යන 2017 සැප්තැම්බර් 21 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශයට අනුමැතිය ලබා දී ඇත. අනෙක් වැව් ප්‍රතිසංස්කරණය සඳහා ද ගොවි සංවිධානවල ඉල්ලීම් පරිදි ප්‍රාදේශීය ගොවිජන සේවා නිලධාරින්ගේ එකගතාවය ලබා ගෙන ඇත. |
| (ආ) | මුදියන්නෑගම වැව, කුඩා ගාලේ වැව, පඹදෙනිගම වැව යන වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ලවා ඉටු කරවා ගැනීමේ ප්‍රතිපත්තිමය තීරණය ලබා ගැනීමට හේතු වූ කරුණු අදාල ලිපිගොනුවල දක්වා නොතිබුණි. | සියළුම තොරතුරු ලිපි ගොනුවලට ඇතුලත් කළ යුතු වීම. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මෙවැනි සුළු වැව් ඉතා විශාල සංඛ්‍යාවක් පවතින බැවින් ඒවා අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන හා තාක්ෂණික හැකියාව එම දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත්ව නැත. තවද මෙම කුඩා වැව් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වාරිමාර්ග පද්ධතිය තුළ පවතින බැවින් ඒවායේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය සඳහා මෙම කුඩා වැව්වල මනා |

| | | | |
|---|---|---|---|
| | | | ක්‍රියාකාරීත්වයද ඉවහල් වේ. |
| (ඇ) | පඹදෙනිගම වැව ප්‍රතිශංස්කරණ කටයුත්තේදී කුඹුරුවලට ජලය නිකුත් කිරීම සඳහා ඉදි කරන ලද සොරොව්වේ ඉහළින් දමා තිබුණු කොන්ක්‍රීට් ලැල්ල වෙන් වන පරිදි පුපුරා තිබීම, වැවේ සිට කුඹුරුවලට ජලය රැගෙන යාම සඳහා අදාල ඇළ මාර්ග ඉදි කර නොතිබීම, යන අඩුපාඩුද නිරීක්ෂණය විය. | ප්‍රමිතියෙන් තොර ඉදිකිරීම් කටයුතු කිරීම පිළිබඳව සොයා බලා කටයුතු කළ යුතු වීම. | එම ගිලා බැසීම නිරීක්ෂණය කරමින් පවතින අතර එම ඉරි තැලීම සඳහා විශේෂ සිමෙන්ති මිශ්‍රණයක් යෙදීමට බලාපොරොත්තු වේ. පඹදෙනිගම වැවේ සිට කුඹුරු දක්වා ඉදි කිරීමට ඇති අදාළ ඇළ මාර්ගයේ ඉංජිනේරුමය ඇස්තමේන්තු සකස් කර ඇත. |
| (ඈ) | ඉදි කරමින් තිබුණු පිටවාන ඉහළ සිට පහළට මීටර් 1 ක් පමණ දුරට ස්ථාන 09 කින් පුපුරා ගොස් තිබීම, එක් ස්ථානයක් පාදමේ සිට ඉහළටම පුපුරා තිබීම සහ පිටවාන ඉදි කිරීම සඳහා යොදා තිබෙන කොන්ක්‍රීට් පදම් (Curing) නොකිරීම යන අඩුපාඩු විය. | -එම- | පිටවාන අවසන් පාදම් බැම්ම **(Cut of wall)** මේ වන විට ඉදිකරමින් තිබුණු අතර විගණන විමසුමෙහි සඳහන් වන පරිදි ඉරි තැලීම් ඇති වී තිබුණේ 2017 වර්ෂයේ දී ඉදිකරන ලද පිටවාන බැම්මෙහිය. **(Crest Wall)**. ඒවා මතුපිටින් දක්නට ලැබෙන ඉරි තැලීම් **(Surface Crack)** වන අතර පසුගිය වර්ෂා කාලයේ දී මෙම වැව වාන් දැමූ නමුත් ඉරිතැලීම්වලින් කිසිදු ජල කාන්දුවක් දක්නට නොලැබුණි. අධික උෂ්ණත්වය පැවති කාල වකවානුවේ සිදු කළ ඉදිකිරීමේ දී ඇති වූ මතු පිට ඉරාතැලීම් **(Surface Crack)** විශේෂ සිමෙන්ති මිශ්‍රණයක් යොදා ප්‍රතිසංස්කරණය කර ඇත. මේ වන විටත් මෙම වැවේ පිරි සැපයුම් මට්ටමට වඩා අඩියක් පමණ ප්‍රමාණයක් ජලය අඩුවෙන් පිරී ඇත. |
| (ඉ) | මුදියන්නෑගම වැව වටා වාහන ගමන් කළ හැකි වන | වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ දී එල්ලංගා | වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් විමසීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | පරිදි වැව් බැම්මට යා කර පස් දමා මාර්ගයක් ඉදි කර වැවට ජලය ගලා එන වැවේ පෝෂිත ප්‍රදේශය වන වැව් ඉහත්තාව අවහිර කර තිබුණි. වැවට හානි වන පරිදි වැව වටා වැව ඉහත්තාවේ මාර්ගයක් සකස් කිරීමෙන් එල්ලංගා පද්ධතියටද හානි වී තිබුණි. | පද්ධතිය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු වීම. | |
| (ඊ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කුඩාගලේ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2016, 2017 සහ 2018 යන වර්ෂවලදී අමාත්‍යාංශයෙන් රු.6,195,216 ක් වැය කර තිබුණ ද වැවේ සොරොව්ව කැඩී තිබුනු බැවින් වැවේ එකතුවන ජලය වගා කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. කුඩා ගලේ වැවෙන් පෝෂණය වන මුළු කුඹුරු අක්කර 95 න් අක්කර 32 රූඩ් 03 පර්චස් 30 ක් එක් පුද්ගලයෙකු විසින් පාරම්පරික ගොවීන්ගෙන් මිලදී ගෙන තිබුණි. එම ප්‍රමාණය මුළු කුඹුරු ප්‍රමාණයෙන් සියයට 34 ක් පමණ වී තිබුණි. 2019 ජනවාරි 09 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී එම කුඹුරු අක්කර 95 ම වගාකර නොතිබුණු අතර වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය කර තිබෙන මුළු මුදල වූ රු.6,195,216 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් වෙනත් වැය ශීර්ෂ සඳහා වියදම් දැරීමට අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර යෝජිත කුඹුරු වගා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/3/13/ජ.කා.ලි. කුරු/2017 සහ 2017.09.21 දිනැති ලිපියෙන් වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙත අදාළ වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමේ දී ඉවත් කරන ලද රොන් මඩ ගොවි සංවිධානයේ ඉල්ලීම මත කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ලබා දී ඇත. ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කරන අවස්ථාව වන විට සොරොව්ව විවෘත කිරීම පිළිබඳව ගැටළුවක් නොතිබුණු බැවින් ඒ සඳහා කිසිදු ඇස්තමේන්තුවක් සකස් කිරීම හෝ ප්‍රතිසංස්කරණ කටයුත්තක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදු කර නොමැත වසර කිහිපයක් සොරොව් දොරටු විවෘත නොකිරීම මීට හේතුව වියහැකි අතර සොරොව්ව යථා තත්ත්වයට පත් කළ පසු අදාළ වැවේ රැස්වන ජලයෙන් වගා කටයුතු සිදු කළ හැකිය. |

**3.2 වත්කම් කළමනාකරණය**

පහත සදහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ හිටපු අමාත්‍යවරයා වෙත ලබා දී තිබූ රු.640,354 ක් වටිනා වත්කම් ආපසු පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ආපසු පවරාගැනීමට කටයුතු කළ යුතු වීම. | අදාල වත්කම් ආපසු ලබා දෙන ලෙස දන්වා ඇති අතර ඉදිරියේදී ලබා ගැනිමට කටයුතු කරනු ලබයි. |

**3.3 පාඩු හා හානි**

පහත සදහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ සිදුවන හානි හා පාඩු වාර්තා කිරීම සහ අය කර ගැනීම සදහා විධිමත් වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබුණි. | පාඩු හා හානි පූර්ණය කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් අනුගමනය කළ යුතු වීම. | අමාත්‍යාංශයේ හානි හා පාඩු වාර්තා කිරිම සහ අයකර ගැනිම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ඉදිරියේදී සකස් කිරීමට කටයුත කරනු ලබයි. |

**3.5 කළමනාකරණ දූර්වලතා**

පහත සදහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සතු කුඹුක්කඩවල වැවේ අයිතිය වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පවරා ගැනීම හා ප්‍රතිසංස්කරණය කිරීමට අදාල අධිකාරී බලයක් ලබා ගෙන නොතිබිය දී ගල්ගමුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් රු.11,535,000 ක ඇස්තමේන්තුවක් සකස් කර වැව් බැම්මේ ඇති ගස් 140 ක් ඉවත් | අමාත්‍යාංශයට අයත් නොවන කාර්යයන් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක නොකළ යුතු වීම. | මේ පිළිබදව වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් විමසීම් කර ඇත. |

කිරීමට ලකුණු කර තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොත්මලේ පුහුණු ආයතනයට අනුමත කාර්යය මණ්ඩලය 30 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 14 ක් වූයෙන් තනතුරු 16 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු වීම හෝ අනවශ්‍ය තනතුරු වේ නම් ඒවා යටපත් කිරීමට කටයුතු කිරීම. | පිලිගනිමි. |
| (ආ) | අනුමත තනතුරු 06 කට අනුමත සංඛ්‍යාව ඉක්මවා 15 දෙනෙකු බඳවා ගෙන තිබුණි. අනුමත කම්කරු තනතුරු 04 කට බඳවා ගෙන නොතිබුණු අතර කොන්ත්‍රාත් පදනම මත 28 දෙනෙකු බඳවා ගෙන වැටුප් හා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.19,577,330 ක් ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වීම. | විගණන විමසුමේ සඳහන් තොරතුරු සඳහා පිළිතුරු සැපයිමට කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ ආයාතනාධිපති ගෙන් විමසීම් කර ඇති අතර පැහැදිලි කිරීම් ලද විගස ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ජනාධිපති ලේකම් ගේ අංක **CA/1/17/1** හා 2010 මැයි 10 දිනැති චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරයාගේ පෞද්ගලික ආරක්ෂක නිලධාරින්ට අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රතිපාදනවලින් දීමනා ගෙවිය නොහැකි වුවත් අමාත්‍යාංශයෙන් හා දෙපාර්තමේන්තුවෙන් පිළිවෙලින් රු.2,200,000 ක් සහ රු. 915,611 ක් ලෙස රු.3,115,611 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන විමසුමෙන් ඉදිරිපත් කර ඇති කරුණු සත්‍ය බව පිළිගන්නා අතර එවකට විෂයය භාර ගරු ඇමතිතුමාගේ දැඩි ඉල්ලීම පරිදි මෙම පෞද්ගලික ආරක්ෂක නිළධාරීන් සඳහා ගෙවීම් කිරීමට එවකට සිටි නිළධාරීන්ට සිදුවී ඇති බව නිරීක්ෂණය වේ. ගරු ඇමතිතුමා හමුවීමට පැමිණෙන මහජනතාව හැසිරවීම හා ඔහුගේ ආරක්ෂාව සඳහා අමාත්‍යතුමා |

| | | | |
|---|---|---|---|
| | | | හට විශ්වාසවන්ත පුද්ගලයන් යොදා ගත යුතු බවට අමාත්‍යවරයා විසින් අවධාරණය කිරීම මත එවකට සිටි ලේකම් තුමාගේ අනුමැතිය මත එම පුද්ගලික ආරක්ෂක නිළධාරීන් සේවයේ යොදවා ගෙවීම් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. ඉදිරියේදී මෙසේ කටයුතු නොකිරීමට වග බලා ගන්නා බව වැඩිදුරටත් දන්වමි. |
| (ඇ) | කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු නාම 05 ක් සඳහා 06 දෙනෙකු ආයතනය විසින් බඳවා ගෙන තිබුණි. කළමනාකරණ සහකාර තනතුරු 1 ක් අනුමත කර තිබුණ ද ඒ සඳහා 10 දෙනෙකු ද අනියම් පදනම මත කම්කරුවන් 25 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක **DMS/**1285 හා 2016 ජූලි 01 දිනැති ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. |
| (ඇ) | කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය සඳහා කථිකාචාර්ය තනතුරු 07 ක් අනුමත කර තිබුණ ද එම කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු නොකර බාහිර දේශකයන් ඒ සඳහා යොදවා ගෙන තිබුණි. 2017 සහ 2018 වර්ෂවල පිළිවෙලින් බාහිර දේශකයන් 25 දෙනෙකුට සහ 11 දෙනෙකුට රු.1,100,835 ක් හා රු.699,400 ක් වශයෙන් එකතුව රු.1,800,235 ක මුදලක් ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක **DMS/**1285 හා 2016 ජූලි 01 දිනැති ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට ඉල්ලීම් සිදු කර ඇත. |